# ආ මග සටහන්



දයාරත්න වීරසේකර
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික, නියෝජ්‍ය විභාග කොමසාරිස්

## සීෂෙල්ස් දූපත් රාජ්‍යයේ නූතන යුගයේ වහල් සේවය?

මෙය ලෝකයේ ජනාවාසයක් ඇති ඉතාම කුඩා දිවයින් වලින් එකකි. "සිල්වට්" දිවයින (Silhouette Island) යන නමින් හඳුන්වන මෙම කොදෙව්ව, ඉන්දියන් සාගරයේ, දකුණු දිගින් නිරක්ෂ රේඛාවට අංශක 7 ක් දකුණෙන් පිහිටි, සීෂෙල්ස් දූපත් සමූහයට අයත්ය. මෙහි ප්‍රධාන දූපත වන මාහේ සිට කිලෝමීටර විසි පහකට පමණ ඈතින් පිහිටා ඇති මෙම දිවයින ප්‍රමාණයෙන්, වර්ග කිලෝමීටර  විසි පහකට පමණ ඈති න් පිහි ඇති ඇති මෙම දිවයින ප්‍රමාණයෙන් වර්ග කිලෝමීටර විස්සත් (4km x 5Km) පමණ වේ. දිවයිනෙහි පවුල් තිහක් පමණ ජීවත් වන අතර එහි මුළු ජනගහනය 200 ක් වන පමණ වේ. දිවයිනේ ස්ථාන තුනක ඇති එකිනෙකට යාබද නිවාස වල මෙම ජනතාව ජීවත් වෙති. මේවා ඉතා කුඩා ගෙවල් වෙන අතර ඒවායේ, ගෘහ භාණ්ඩද ඇත්තේ සීමිත ප්‍රමාණයකි.

දූපතේ වැසියන්ගෙන්, විසි පස් දෙනෙක් පමණ දිවයින අයිති වැවිලි සමාගමේ සේවකයෝ වෙති. මෙම දිවයින සොයාගත් කාලයේ, (1810 දී පමණ) සිටම අසල පිහිටි මුරුසි රටෙහි පදිංචිව සිටි ප්‍රංශ ජාතික ධනවත් ව්‍යාපාරික පවුලකට අයිති දේපලක් ලෙස එය භාවිත විය. ඔව්හු මෙම දිවයිනෙහි මුලින්ම කුරුඳු, එනසාල්, කරාබු නැටි, ගම්මිරිස් වැනි කුළුබඩු ශාක වගාකර තිබේ. එම වගාවන් කිරීම සඳහා නැගෙනහිර අප්‍රිකාවේ රටවලින් සේවකයින් ලබා ගෙන ඇත. කුළු බඩු වගාව සාර්ථක  නොවු නිසා පොල්, පලතුරු සහ එළවළු වගාව පසුව ආරම්භ කර තිබේ.



සිල්වට් දිවයින, මාහේ සිට පෙනෙන ආකාරය

මේ කාලයේ, අධිරාජ්‍යවාදී මානසිකත්වයකින් උද්දාම වී සිටි යුරෝපීය




රටවල් කිහිපයක ධනවත්තු තම වතු පිටි සහ වගාබිම් වල සේවය සඳහා ග්‍රාමිකයින් ලබා ගැනීම පිණිස ඒ වන විට අඳුරු මහද්වීපයක්ව පැවති අප්‍රිකාව වෙත් සිත් යොමු කළහ. අප්‍රිකා මහාද්වීපයට නැව් ගමනාගමනය ආරම්භ කළ මුල් කාලයේ සිට, ඔවුන් වහල් වෙළඳාම නම් මහත් අමානුෂික මිනිස් ජාවාරම් ක්‍රියාවලියක් පටන් ගෙන තිබේ. අප්‍රිකා මහාද්වීපය අභ්‍යන්තරයේ පිහිටි වනගත ප්‍රදේශවලින් බලෙන් තම ග්‍රහණයට ගන්නා ලද, හැඩි දැඩි මිනිසුන් යුරෝපීය රටවල සහ ඇමරිකාවේ කෘෂිකාර්මික බිම්වල වහල් සේවකයින් ලෙස මුදලට විකිණීම මෙහි ආරම්භයයි. ශත වර්ෂ කිහිපයක් තිස්සේ පැවති මෙම අමානුෂික ජාත්‍යන්තර වහල් වෙළඳාම, 1807 වර්ෂයේදී, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ පාර්ලිමේන්තුව මඟින් අහෝසි කරන ලදි. මේ සමගම බ්‍රිතාන්‍ය යටත් විජිත සියල්ලේම වහල් වෙළඳාම අහෝසි කරන ලද බව ප්‍රකාශ විය. එසේ වෙතත්, මුලින් වහලුන් වශයෙන් පැමිණ, වහල් මෙහෙවර කළ අයගෙන් පැවත එන්නන්ටද, ඉහළ සමාජ මට්ටමක් ලබා ගැනීම දුෂ්කර විය. වහල් සේවය නීතියෙන් අහෝසි වූයේ යයි ප්‍රකාශ කිරීමෙන් පසුවද තවත් බොහෝ කල් යනතුරු, එම මිලේච්ඡ ව්‍යාපාරය රහසිගතව ක්‍රියාත්මක වි තිබේ.

බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වූ සීෂෙල්ස් රටටද, ඒ කාලයේ කෘෂිකාර්මික කටයුතු සඳහා අප්‍රිකානු වහල් සේවකයින් ලබාගෙන ඇත. ඔවුන්ගෙන් පැවත එන සමහර අය පරම්පරා හත අටකට පසුව වූවද, තවමත් ඒ තත්වයේම පසුවීම ඛේද ජනක තත්ත්වයකි. විශේෂයෙන්ම සිල්වට් දිවයිනේ වැසියන් මේ අභාග්‍ය සම්පන්න ඉරණමට ගොදුරුවී තවමත් එහිම ගැලි සිටින පිරිසක් ලෙස සැලකිය හැකිය.

කල්යාමේදී සිල්වට් දූපතේ කෘෂිකාර්මික වගාවන්ගෙන් සාර්ථක ආදායමක් නොලැබුණු නිසා විදේශිය අයිති කරුවන් විසින්, දිවයින විකුණා දැමීමට තීරණය කරන ලදී. මෙම දූපතේ ජීව විද්‍යාත්මක අගය ගැන සැලකිලිමත් වූ සීෂෙල්ස් රජය 1983 වසරේ, ප්‍රංශ හාම්පුතුන්ගෙන් දිවයින මිලට ගෙන, පසුව එහි සංවර්ධන කටයුතු සඳහා, ජෛව සංවර්ධන නිපුණතාවකින් යුක්ත රාජ්‍ය නොවන සංවිධානයකට පවරන ලදි. එසේ කිරීමේ දි එහි පදිංචිව සිටි සේවක පිරිසද කලින් සිටි ආකාරයටම නව පාලකයින්ගේ ශ්‍රාමිකයින් බවට පත් වී ඇත.

ඉන්දියන් සාගරයේ බටහිර ප්‍රදේශයේ පිහිටා ඇති සිල්වට්, ඉතාමත් විරල ජීවින් සිටින ඉහල ජෛව විවිධත්වයක් සහිත




ප්‍රධාන දූපත වන 'මාහේ' සහ සිල්වට් දිවයින

කුඩා දිවයිනකි. දැනට දශක තුනකට පමණ ඉහතදී, මා සීෂෙල්ස් බහු තාක්ෂණ ආයතනයේ සේවය කරද්දී, මෙම මනරම් දිවයිනෙහි ජෛව විවිධත්වය පිළිබඳ අධ්‍යයන කාර්ය සැසියකට සිසුන් සහභාගී කර වීම සඳහා, මට අවස්ථාව ලැබුණි. මටද, ඔවුන් සමඟ එම අධ්‍යයනවල නිරත වීමට හැකිවිය.

මෙම කුඩා දිවයිනේ, වඳවීයාමේ තර්ජනයට අතිශයින් භාජනවී ඇති, වලිගයේ කොලොපුවක් මෙන් හැකිලිය හැකි පටලයක් වැනි, විකරණයක් සහිත ඉතාමත් විරල එරටට ආවේණික (ඒක දේශික) වවුලෙකු සිටින බව අසන්නට ලැබිණ. (සංසරක්ෂිත මධ්‍යස්ථානයේ ෆෝමලීන් ද්‍රාවණයක දැමූ දර්ශකයක් පමණක් අපට දැකගැනීමට හැකි වීය.) එම මධ්‍යස්ථානයෙන් ලබාගත් තොරතුරු වලට අනුව ලෝකයේ වෙනත් කිසිම ස්ථානයක නොමැති, මෙම වවුලන් මෙහි සිටින තිස් දෙනෙකුගේ පමණ රංචුවකට සීමාවී තිබීම නිසා වඳ වී යාමේ තර්ජනයේ අන්තයටම පැමිණ ඇති බව පෙනේ. "සොබා දහම සුරැකීමේ අන්තර් ජාතික සංගමය (International Union for Conservation of Nature - I.U.C.N.)  විසින් ඔවුන්ගේ රතු දන්ත නාමාවලිය මගින් හෙළ කර ඇති ආකාරයට මෙම වවුලු විශේෂය වඳවී යාමේ තර්ජනයට අතිශයින් ගොදුරු වී තිබේ. එම තත්තවය මඟ හැර ගනිමින් මොවුන් සංරක්ෂණය කිරීම සඳහා ජාත්‍යන්තර සංවිධාන මහත් පරිශ්‍රමයක් දරන බවද දැනගන්නට ලැබිණ.

මීට අමතරව, මෙම දූපත් සමූහයේ තිබෙන, ඒක දේශික ශාක 75කින් 61 ක් පමණ සිල්වට් දිවයිනේ පමණක් තිබෙන බවද, එම දිවයින කුරුළු පාරාදීසයක් බවද නිරීක්ෂණය කර තිබේ. අගනා ජෛව විවිධත්වයක්ද සහිත, ජීව විද්‍යාත්මක



(ඒක දේශික) වවුල් විශේෂය (Coloura Seychellensis)

වටිනාකම් නිසාම, 1987 සිට සිල්වට් දිවයිනෙහි මධ්‍ය කඳුකර කොටස සහ දිවයින




සිල්වට් දිවයින සංරක්ෂණ මධ්‍යස්ථානයේ ලිපි ශීර්ෂය

අවට මුහුදු තීරය "රක්ෂිත ජාතික උද්‍යාන දෙකක් " ලෙස නම් කර තිබේ.
මෙම අපුරු දිවයිනෙහි ජෛව විවිධත්වය රැකගැනීම සහ වඳවී යාමේ තර්ජනයට ගොදුරුවී ඇති ජීවීන් සංරක්ෂණය සඳහා ජාත්‍යන්තර වනජීවි සංරක්ෂණ සංවිධාන රාශියක අනුග්‍රහය ලැබෙන මධ්‍යස්ථානයක්ද පිහිටුවා තිබේ.

ස්වභාව සෞන්දර්යය සහ ජෛව විවිධත්වය සහිත මෙම දිවයිනෙහි ජිවත්වන මිනිසුන්ගේ ජීවන රටාව පිළිබඳව ද විමසිලිමත් වීම වැදගත්ය. මොවුන් වර්තමාන ලෝකයේ පවතින අති ධාවනකාරි ජීවන ක්‍රමයෙන් මිදි තමන්ට ආවේණික දිවි පැවැත්මක් ගෙන යාම සුවිශේෂි ලක්ෂණයකි.

රජය මගින් සිල්වට් දිවයිනේ සියලුම කාර්ය භාරයන්, ඉටු කිරීම "දූපත් සංවර්ධන සමාගම" නම් ආයතනයක පවරා දී තිබේ දූපතෙහි කෘෂිකාර්මික කටයුතු කිරීම සඳහාත්

35 වන පිටට